දුරකථන / தொலைபேசி / Telephone: 2698471, 2698475, 2698490

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2693866

විද්‍යුත් තැපෑල / இணையத்தளம் / www.health.gov.lk / e-mail: postmaster@health.gov.lk


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය / எனது இல / My No.: NCD/72/2013

ඔබේ අංකය / உமது இல / Your No. :

දිනය / திகதி / Date: 2014.10.16

**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**சுகாதார அமைச்சு**
**Ministry of Health**

පොදු චක්‍රලේඛ අංක: 02-143/2014

සියළුම පළාත් ලේකම්වරුන්,

පළාත් / නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,

පළාත් රෝහල් වෛද්‍ය අධිකාරීවරුන් සහ

ආයතන ප්‍රධානීන්.

<u>ජාතික විෂ නිවාරණ සතිය - 2014 නොවැම්බර් මස 10 සිට 16 දක්වා</u>

ජාතික විෂ නිවාරණ සතිය ධූලකවේදය හා ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මගින් 2007 වර්ෂයේ සිට අඛණ්ඩව පවත්වා ගෙන යන අතර එමගින් විෂ වැළැක්වීම් හා ප්‍රතිකාර පිළිබඳව මහජනතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම පුද්ගලයන් දැනුවත් කරනු ලබයි.

පසුගිය වසර කිහිපය ඇතුළත දී බෝවන රෝගවලට වඩා බෝනොවන රෝග හේතුවෙන් රෝහල්ගත වන සහ මියයන රෝගීන් සංඛ්‍යාව වැඩිවී ඇත. වර්තමාන විද්‍යාත්මක තොරතුරුවලට අනුව පාරිසරික විෂ සහ බෝනොවන රෝග ඇතිවීමේ ප්‍රවනතාවයක් ඇතිබවද පැහැදිලිව පෙනී යන්නකි. මෙහිදී ප්‍රධානතම බෝනොවන රෝග අතර දියවැඩියාව, අධි රුධිර පීඩනය, ස්ථුලතාවය, පිළිකා සහ වකුගඩු රෝග ප්‍රධාන වෙයි. වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශයේ දත්තවලට අනුව දියවැඩියාව සහ අධි රුධිර පීඩනය නිසා වර්ෂ 2012 රෝහල් ගතවූ රෝගීන් සංඛ්‍යාව පිළවෙලින් 78,225 ක් සහ 98,345 වන අතර මරණ සංඛ්‍යාව 675 හා 268 වේ. උතුරුමැද පළාතේ දැනට වාර්තාගත වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව 22,000 ක් පමණ වේ. පරිසරයට එකතුවන කෘෂි රසායන ද්‍රව්‍ය සහ නවීකරණය වූ නූතන පරිභෝජන රටාව හරහා මානව දේහ තුළ තැන්පත්වන විෂසහිත රසායනිකයන්හි වැඩිවීමක් දක්වයි. මෙකී පසුබිම තුළ බෝනොවන රෝග වැළැක්වීමෙහි ලා පාරිසරික විෂ, මානව චර්යා රටාවන් සහ පෝෂණ අතර සබැඳියාව නිවැරදිව හඳුනාගැනීමත්, බෝනොවන රෝග වැළැක්වීමේ ලා යාවත්කාලීන විද්‍යාත්මක තොරතුරු නිවැරදිව ප්‍රජාව වෙත සංනිවේදනය කිරීමත් අතිශය වැදගත් වෙයි. එකී නිවැරදි විද්‍යාත්මක දැනුම ප්‍රජාව වෙත සංනිවේදනය කිරීම සඳහා ජාතික විෂ නිවාරණ සතිය මෙම වසරේදී ද පැවැත්වීමටත්, මෙම වසරේ තේමාව ලෙසින් "පාරිසරික විෂ සහ බෝනොවන රෝග" ලෙසත් තීරණය කරනු ලැබ තිබේ.


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

ප්‍රතිකාර සඳහා අවශ්‍ය පහසුකම් සහිත හා දැනුවත් කිරීමේ පහසුකම් සහිත සෞඛ්‍ය සේවා ආයතන පද්ධතීන් සහ දැනුවත් කිරීමේ හැකියා ඇති ජනතාවක් සිටින ශ්‍රී ලංකාව තුළ ඉහත අරමුණ ඉටුකරලීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

නියමිත කාල වකවානුව - 2014 නොවැම්බර් මස 10 සිට 16 දක්වා
තේමාව - "පාරිසරික විෂ සහ බෝනොවන රෝග"

අරමුණු:

1. දේහගතවන පාරිසරික විෂ ද්‍රව්‍යයන් අවමකරගැනීම සඳහාත්, බෝනොවන රෝග තත්ත්වයන් ඇතිවීම සහ එමගින් මියයන සංඛ්‍යාව අවම කර ගැනීම.
2. ධූලකවේදය සහ ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ කාර්යභාරය ඵලදායී ලෙස සහ ඒ සඳහා දායක කරගැනීම පිළිබඳ සියළුම පාර්ශවයන් දැනුවත් කිරීම.
3. මෙම නිවාරණ කටයුතු සඳහා සියලු අදාළ පාර්ශව සමඟ එක්ව ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් තීරණය කොට ක්‍රියාවට නැංවීම.
4. කාලීන වශයෙන් වැදගත් වන බෝනොවන රෝග හා සබැඳෙන යාවත්කාලීන වූ විද්‍යාත්මක දැනුම සහ බෝනොවන රෝග ඇතිවීම අවම කරගැනීම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.

මෙම සතිය තුළ යෝජිත කාර්යයන්:

1. කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ප්‍රජාව දැනුවත් කිරීමට අධ්‍යාපනික වැඩසටහන් හා ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් ආයතනය තුළ හා ප්‍රජා මට්ටමෙන් සංවිධානය කිරීම. උදා: අධ්‍යාපනික දේශන, අධ්‍යාපනික ප්‍රදර්ශන, අධ්‍යාපනික පා ගමන්.
2. ධූලකවේදය සහ ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ සේවාවන් ලබා ගැනීම සඳහා සාමාන්‍ය මහජනයා දැනුවත් කිරීම හා යොමු කිරීමේ අරමුණින් විද්‍යුත් හා ලිඛිත මාධ්‍ය නියෝජිතයින් ද සම්බන්ධ කර ගැනීම.
3. වැඩ සටහන සඳහා සහභාගීත්වය සහ අනුග්‍රාහකත්වය දක්වන විවිධ නියෝජිතයන් වෙතින් ජාතික මධ්‍යස්ථානය මඟින් ඉටුකිරීමට යෝජනා වී ඇති හා වත්මන් කාර්යයන් පිළිබඳව අදහස් සහ යෝජනා ලබා ගැනීම.
4. මෙකී චක්‍රලේඛය මඟින් දැක්වෙන පරිදි දීප ව්‍යාප්ත මට්ටමෙන් ප්‍රජාව විධිමත්ව දැනුවත් කිරීම පිණිස වැඩ සටහන් සඳහා උපදෙස් සැපයීම, පරිසරයට හා මහජන සෞඛ්‍යයට සිදුවන හානි අවම කරලීම.
5. "ජාතික විෂ නිවාරණ සතිය" ක්‍රියාත්මක වන සතිය තුළ සුදුසු පරිදි ආයතනය තුළ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක පුවරුවක් ප්‍රදර්ශනය කිරීම.
6. රෝහල තුළ අධ්‍යාපනික ප්‍රදර්ශන, වැඩමුළු සහ දේශන පැවැත්වීම.

මේ සඳහා ජාතික විෂ නිවාරණ සතිය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳව සවිස්තර වාර්තාවක් සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් විසින් එම කාර්යයන් නිම කිරීමෙන් පසුව අධ්‍යක්ෂ / බෝනොවන රෝග වෙත ඉදිරිපත් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් අවම වශයෙන් සුදුසු පරිදි එක් වැඩ සටහනක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, දිසා වෛද්‍ය නිලධාරී, මහ රෝහල් සහ ශික්ෂණ රෝහල් මට්ටමෙන් ක්‍රියාත්මක කළ යුතුය. මෙම වැඩ

සටහන සම්බන්ධීකරණය කරනු ලබන කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ ස්ථාපිත ධූලකවේදය සහ ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය වෙතින් මේ පිළිබඳව වැඩිදුර විස්තර සහ තාක්ෂණික යෙදවුම් දූරකථන අංක 011-2686143 / 011-2691111 - දිගු අංක 2430 ඔස්සේ එම මධ්‍යස්ථානය අමතා ගත හැක.

මෙම චක්‍රලේඛය කාර්ය මණ්ඩලයේ සියළුදෙනා අතර බෙදාහැරීම සහ දැන ගැනීමට සලස්වන ලෙස ඉල්ලා සිටින අතර එහි ඇතුළත් කරුණු ක්‍රියාත්මක කිරීමට වගබලා ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

මෙම තේමාව යටතේ සකසන ලද සිද්ධාන්තමය කරුණු ඇතුළත් පත්‍රිකා සහ පෝස්ටර් ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය වෙතින් ලබා ගත හැක.අවශ්‍යතාවය මත අදාළ සිද්ධාන්ත ඔබ වෙත තැපැල් මාර්ගිකවද එවිය හැක.

ඔබ ප්‍රදේශය තුළ පවත්වනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාව 2014 දෙසැම්බර් 28 දිනට පෙර ධූලකවේදය සහ ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

වෛද්‍ය. පි. පී. මහිපාල

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

සෞඛ්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය පී. පී. මහිපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
385, "සුවසිරිපාය"
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත.
කොළඹ 10.

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10, 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.